# කොස්

බඩ ගිනි වී මණුලොව ආ සක්දෙව්දූට  කොස්
අඩ මානේට නොකෑ ගෙඩිත් තැම්බුවාලු  කොස්
කඩ පිම්මේ ඉදෙන විටදි සුවඳ දැනී  කොස්
හැඩ වැඩ වී රස බැලූ ඈ හෙරලිය විය  කොස්

එදා පටන් මෙලෙස කන්න හුරු උනාලු  කොස්
සදා පැහිය, පොළොස් ඇඹුල, නියඹලාව  කොස්
බෙදා දෙන්න කිරිඑතනාට කිරි එරෙන්න  කොස්
මෙදා කොහිද එහෙම රසක් කිරලා දෙන  කොස්

ගින්දර වගේ මද්දල හඬ ඇසුන කොටය  කොස්
සුන්දර ලෙස රටා මැවින දැව කැටයම්  කොස්
මන්දිර වල වියන් ඇඳට හතර ඇන්ද  කොස්
අන්දර ගස් නොවෙයි හැදුනේ මායිම් වල  කොස්

ඇඟට පනින මදුමේහෙය අඩුවන්නට  කොස්
මතට විසට රැඳුන බලය වලකන්නට  කොස්
තදට ඇඟට එන නින්දට හොඳ මැල්ලුම  කොස්
පොළට වැටෙන පැකට් වලිනි අපි කන්නේ  කොස්

හදන පොළොස් මැල්ලුමටත් මීතෙල් දා  කොස්
හැදෙන වාත දෝස කැපෙන සිබ්බි බැදුම  කොස්
ඉදෙන විටත් සුවඳ බෙදෙන කළුපොල් ඇට  කොස්
තිබෙන ඉඩක් කොහිද බඩට දැමුනම කිරි  කොස්

මහරගමින් සොයා ගත්ත මදුලුත් රහ  කොස්
ගහ පුරාම සුවඳේ බෑ රෝස වරක  කොස්
මහතක් නෑ පොඩි ගෙඩි ඇති මණ්ඩූර් කුරු  කොස්
කහ පැහැ ඇති පොතු ඇට නැති කුරුවිට රස  කොස්

කොස් මාමාගෙ ආතර් වි දියෙස් නමට  කොස්
ගස් වල ලබු සේ දිලෙනා "පාදර් ලොන්"  කොස්
පස් වැලියට සඟවා තැබූ වැලි මුසු ඇට  කොස්
මස් මොකටද රසකල විට මාලුව අවු  කොස්

අපට ලැබුන සම්පතක්ය අප රට ඇති  කොස්
දැයට දැනට අමතක උන මෙරට තිබෙන  කොස්
රටට දෙන්න සොයමින් ගෙන බද්ධ කරමු  කොස්
එවිට හැකිය කන්න දෙන්න මුලු රටටම  කොස්




**කුලසිසි ප්‍රියන්ත වීරසූරිය,**
**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය),**
**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,**
**පොළොන්නරුව.**